ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.03.12** **චක්‍රලේඛ අංක : 20/2026**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**බාලදක්ෂ නායක - ලී පදක්කම් පුහුණුව**

**155 වන IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාව**
**2026 මැයි මස 16 සිට 22 දක්වා**
**පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථකව නිම කළ, **බාලදක්ෂ නායක/නායිකාවන්** සඳහා **බාලදක්ෂ** අංශයේ IV අදියර උසස් පාඨමාලාව **2026** මැයි මස **16** වන සෙනසුරාදා සිට **22** වන සිකුරාදා දක්වා **පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී** පුහුණුකිරිමේ නායක **ඒ කේ මහේන්ද්‍රන් මහතාගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 මාර්තු මස 28 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ පුහුණුකිරිමේ අංශයට යොමු කරවීමට කටයුතු කරන්න.

පාඨමාලා ගාස්තුව : රු. 6,000/- කි.

සම්මුඛ පරීක්ෂණය :
**2026** අප්‍රේල් මස 18 **වන සෙනසුරාදා දින පෙ.ව 10.00** ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට සම්පූර්ණ බාලදක්ෂ නිළ ඇඳුමින් පැමිණිය යුතු ය.

➢ **IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**

i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.
ii. **2025** වසර සඳහා අධිකාරි පත්‍රයක් ලබා තිබීම හෝ **2025** වසරට නවීකරණය කර තිබීම.
iii. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර **02** ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.
iv. **2** වන අදියර සහතිකය (**2** වන අදියරින් පසු පාඨමාලාව පටන් ගන්නා දිනට මාස **06** ක සේවා කාලයක් තිබිය යුතු ය.)

65
9
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131 / +94 11 2 433 512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

➢ **<u>සම්මුඛ පරීක්ෂණයට පැමිණිමේ දී රැගෙන ආ යුතු දේ :</u>**

1. **තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතු ය.**
2. **දින 06 ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.**
3. **2 වන අදියර සහතිකය**
4. **වලංගු අධිකාරි පත්‍රයේ පිටපතක්**
5. **බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තා පොත (1-5 පොත) සම්පූර්ණ කර පැමිණීම.**
6. **එදින සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.**

**<u>සැලකිය යුතු කරුණු</u> :**

- ✓ **අධිකාරි පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.**
- ✓ **පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.**

**ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරණ ලෙස කාරුණික ව දැනුම් දෙමු.**

**ස්තූතියි.**

**මෙයට,**
**බාලදක්ෂ සේවයේ නියුතු,**

**කර්නල් පද්මලාල් පෙරේරා**
**ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්**

**නීතිඥ මනෝජ් නානායක්කාර**
**ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්**

**<u>පිටපත</u> - 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්**

**2. සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**